**ශීර්ෂය 301 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 301 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 08 දින සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 76.18 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 72.31 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3.87ක් හෙවත් සියයට 5.08 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 64.72 | 61.13 | 3.59 | 5.55 |
| මූලධන | 11.46 | 11.18 | 0.28 | 2.44 |
| **එකතුව** | **76.18** | **72.31** | **3.87** | **5.08** |

## 2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 30101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.00 | 4.23 | 3.00 | 2.58 | 20.00 | 12.39 |

## 2.3 විගණන නිරීක්ෂණය

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පිළියෙල කර ශේෂ ඉදිරියට ගෙන නොතිබුණි.

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විෂයය අංක 30101 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් 2016 අංක 23 දරන විසර්ජන (සංශෝධිත) පනතේ iii උපලේඛනයේ පනවා තිබූ රු.3,000,000 ක් වූ අවම ලැබීම් සීමාවට රු.421,834 කින් ළඟා වී නොතිබුණු අතර මෙම සීමා නොපිළිපැදීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය 2017 සැප්තැම්බර් 30 දින වන විටත් ලබා ගෙන නොතිබුණි.

(ආ) විෂයය අංක 30101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,120,964 ක් විය. එම හිඟ හිටි ණය ශේෂ තුළ වර්ෂ 01 සිට වර්ෂ 13 ක් දක්වා වූ කාලයට අදාළ ණය ශේෂ එකතුව රු.125,514 කි. වර්ෂ 13 ට වඩා පෙර සිට පැවති ණය ශේෂ එකතුව රු.927,849 ක් වූ අතර සහ කාලය සඳහන් කිරීමට නොහැකි ණය ශේෂ එකතුව රු.67,601 ක් විය. එම ණය ශේෂ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.3 කාර්යසාධනය

------------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

(අ) ජාතික මට්ටමේ සමුපකාර සමිති 16 ක් ස්ථාපිත කිරීම ඉලක්කය වුවත් 2016 දෙසැම්බර් 31 දින වන විට සමිති 03 ක් පමණක් ස්ථාපිත කර තිබුණි.

(ආ) සමුපකාර සමිතිවල පවතින අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සැලසුම් කළ ඉලක්කයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සමුපකාර සමිතිවල ආරවුල් බේරුම් කිරීම සහ උසාවි බල ගැන්වීම් අවස්ථාවන් 750 ඉලක්ක කළද සමාලෝචිත වර්ෂයේදී තීන්දු 129 ක් පමණක් ලබා දී තිබුණි.

(ඈ) සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබූ නමුත් සුදුසු ව්‍යාපෘති කිසිවක් සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමුපකාර සමිති / සංගම්වල 2016 වර්ෂය ආරම්භයේ පැවති ලැබිය යුතු දායක මුදල් රු.44,773,055 කින් සමාලෝචිත වර්ෂයේදී රු.4,869,469 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමුපකාර සංවර්ධන හා සමුපකාර අතිරික්ත අරමුදල් මගින් සමුපකාර සමිති සඳහා ලබා දුන් ණය මුදල් වලින් 2015 දෙසැම්බර් 31 දිනට රු.616,176,853 ක මුදලක් ණය හා පොලී වශයෙන් අයකර ගැනීමට තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ශේෂයෙන් රු.3,000,988 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 44 (v) වගන්තිය ප්‍රකාර ලියාපදිංචි කරන ලද සෑම සමිතියකම වර්ෂයකට වරක් ගිණුම් විගණනය කළ යුතුය. එසේ වුවද 2016 වර්ෂයේදී ගිණුම් වාර්තා 26 ලැබී තිබූ අතර ඉන් සමිති 02 ක පමණක් විගණනය අවසන් කර විගණන වාර්තා යවා තිබුණි.

(ඈ) නියමිත කාල පරිච්ඡේදය තුලදී ගිණුම් වාර්තා සමුපකාර සමිති මගින් ලබාගෙන විගණන කටයුතු සඳහා යොමු කරවීමට සුදුසු ක්‍රියාමාර්ග 2016 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

(ඉ) 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව අක්‍රීය සමුපකාර සමිති 16ක් හඳුනා ගෙන 50 (අ) වාර්තාව ලබා ගැනීම, ලියාපදිංචිය අවලංගු කිරීමේ දැන්වීම් පල කිරීම, ඈවරකරුවන් පත් කිරීම සහ ඈවර කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.එසේ වුවද 2016 වර්ෂයේ ප්‍රගතිය සමඟ සැසඳීමේදී 50 (අ) වාර්තාව ලබා ගැනීම සඳහා සමිති 03 ක් පමණක් හඳුනා ගෙන තිබුණි. සමුපකාර සමිති ඈවර කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් අක්‍රිය සමිතිවල පවතින වත්කම් අනිසි භාවිතය මෙන්ම ඌණ උපයෝජිත තත්ත්වයට පත් වීමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 2016 දෙසැම්බර් වන විට සමුපකාර සමිති 13 ක් අක්‍රිය තත්ත්වයට පත්ව තිබුණි. මෙම සමිති වලින් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.22,413,246 ක මුදලක් ණය වශයෙන් සමුපකාර දෙපාර්තමේන්තුවේ අරමුදල් වෙත අයවීමට පැවතුණි. මෙම සමිතිවලින් අයවීමට ඇති ණය පියවා ගෙන ඈවර කටයුතු ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 04 | 05 |
| (ii) තෘතියික මට්ටම | 07 | 06 | 01 |
| (iii) ද්විතියික මට්ටම | 105 | 78 | 27 |
| (iv) ප්‍රාථමික මට්ටම | 20 | 12 | 08 |
| **එකතුව** | **141** | **100** | **41** |